# මායො කන්දේ අඹ රහස



ලිනුකි රවින්‍යා ජයවර්ධන

# මායා කන්දේ
# අබි රහස

ලිනුකි රවින්‍යා ජයවර්ධන

**මායා කන්දේ අඹ රහස**

කතෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2026

කතාව සහ චිත්‍ර

**ලිනුකි රවින්‍යා ජයවර්ධන**

2 ශ්‍රේණිය C

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

ISBN 978 - 624 - 211 - 345 - 6

# පිදුම

ගොඩක් කල්

මුළු රටට.....

හොඳ දූවරුන් දෙන

සෙංකඩගල පුර වැජඹෙන

මහාමායා විදු මෑණියන්ට

පුදමි මේ පොත

ආදරෙන්.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධණය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# ආණ්ඩුකාරතුමාගේ සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය හා බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනිය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026.05.10

# දියවඩන නිලමේතුමාගේ සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව,
2026.05.10

ඔන්න යාළුවනේ මායා කන්ද කියලා කන්දක් තිබ්බා. මේ කන්ද උඩ හොඳ යාළුවො පිරිසක් හිටියා. ලේන් පැංචා, හා පැංචා, වඳුරු පැංචා, ජිරාෆ් හාමි සහ වහු පැටියා තමයි මේ යාළුවො ටික.



දවසක් ලේන් පැංචා ටිං.... ටිං..... ටිං.....
සද්දෙත් එක්ක අඹ ගහ උඩ ඉඳගෙන
රස අඹ කනවා. ම්...... ම්...... ම්..... හරිම
රස අඹ...! ලේන් පැංචට කදිම අදහසක්
ආවා. යාළුවේ , යාළුවේ..... අපි අඹ
අයිස් ක්‍රීම් හදමුද කියලා අනිත්
යාළුවන්ගෙන් ඇහුවා.

ඔව්... ඔව්... අපි අඹ අයිස් ක්‍රීම් හදමු.
ඒක හොඳ අදහසක් කියලා හා පැංචා
කිවුවා. පීරාග් හාමිත් වඳුරැ පැංචත් ඒ
අදහසට උඩින්ම කැමති වුනා.

ඉතින් ලේන් පැංචා කහපාට ඉදුනු අඹ
ටිකක් කඩලා හා පැංචට දුන්නා.





හා පැංචා අඹ ගෙඩිවල පොත්ත ගලවලා අයින් කලා. ඊට පස්සෙ අඹගෙඩිය කොටු කොටු හැඩයේ කෑලි වලට කැපුවා. භාජනයකට දාලා හැන්දෙන් අඹ කෑලි ටික පොඩි කලා.

එයාලගෙ යාළු ජිරාෆ් හාමිත් මේ අඹ ක්‍රීම් හදන වැඩේට උදව් කරන්න ආවා.

සෙල්ලම් කර කර හිටිය වඳුරු පැංචත්. වහු පැංචත් හනි හනිකට එතනට ආවා. වහු පැටියා හොයාගෙන ආපු එළදෙන අම්මා මේ අපූරු යාළුවන් අඹ අයිස් ක්‍රීම් හදන හැටි දැක්කා.

අඹ අයිස් ක්‍රීම් හදන්න මම කිරි දෙන්නම් කියපු එළදෙන අම්මා එයාගේ කිරි දොවලා අරගෙන දුන්නා.



හා පැංචා ළඟ තිබ්බ පොඩි කරපු අඹ කෑලි භාජනයට ඒ කිරි එකතු කළා. හොඳින් කළවම් කළා.

හා පැංචා අඹ කිරි මිශ්‍රණයෙන් පොඩ්ඩක් අතට අරන් රස බැලුවා. කිරි රසයි අඹ රසයි එකතු වෙලා හරිම හරි රසක් ! එයින් ටික ටික අනිත් යාළුවන්ටත් රස බලන්න දුන්නා. අඹ අයිස් ක්‍රීම් මිශ්‍රණයේ රස බලපු යාළුවෝ ටික උඩ පැන පැන අත්පුඩි ගසමින් සතුටින් ඉපිලුනා.

හා පැංචා මේ අඹ අයිස් ක්‍රීම් මිශ්‍රනය එයාලගේ ගෙදර අයිස් පෙට්ටිය ඇතුළෙන් තිබ්බා. අයිස් ක්‍රීම් එක හැදෙන්න. රෑත් වීගෙන එන නිසා යාළුවෝ නිදාගන්න තම තමන්ගෙ ගෙවල්වලට ගියා.



ඊළඟ දවසෙ උදේම යාළුවො ටික

අවදිවෙලා අයිස් ක්‍රීම් එක බලන්න හා

පැංචගෙ ගෙදරට එකතු වුනා.

හරිම ලස්සනයි බලන්න. කහ පාටින්

පුළුන් වගේ.....
අඹ අයිස් ක්‍රීම් එක හොඳට හැදිලා.

යාළුවො එකතුවෙලා අඹ අයිස් ක්‍රීම්

එක කොටස් දෙකකට බෙදුවා. අඹ

අයිස් ක්‍රීම් එක කොටසක් යාළුවො ටික

බෙදා ගෙන කෑවා. අනිත් කොටස මායා

කන්ද උඩ ඉන්න ගමේ අනිත් අයට

විකුණන්න කතා කර ගත්තා.



පිරාෆ් යාළුවා ලස්සන අයිස් ක්‍රීම් කඩයක් හැදුවා. මායා කන්දෙ ඒ අයිස් ක්‍රීම් කඩේ අයිස් ක්‍රීම් ටික ඉක්මණින්ම විකිණිලා ඉවර වුනා. මේ යාළුවන්ගේ අඹ අයිස් ක්‍රීම් එකේ රස ගැන මායා කන්ද පුරාම පැතිරිලා ගියා. ඉතින් යාළුවෝ කට්ටියට හරිම සතුටුයි.





යාළුවෝ ටික එකතු වෙලා අඹ අයිස් ක්‍රීම් කඩෙන් එකතු වුන සල්ලි ටික ගණන් කළා. මේ සල්ලි වලින් අප මොනවද කරන්නේ ? යාළුවන්ට ඊළඟට ආව ප්‍රශ්නය ඒකයි.

අපි මේ සල්ලි වලින් පොත් පත් අරන් ඒවා මායා කන්ද පාමුල තියෙන ඉස්කෝලේ අයියලා අක්කලා නංගිලා මල්ලිලාට දෙමු. පීරාග් හාමි යෝජනා කළා.

හරිම අගෙයි...හරිම අගෙයි... කදිම අදහසක් යාළුවෝ හැමෝම ඒ අදහසට කැමති වුනා.


ඉස්කෝලේ

ඉතින් අඹ අයිස් ක්‍රීම් විකුණලා ගත්ත සල්ලි දීලා ගත්ත පොත් හරිම ලස්සනට ලෑස්ති කළා. මායා කන්ද පාමුල තියෙන ඉස්කෝලේ අයියලා, අක්කලා, නංගිලා මල්ලිලාට ඒ පොත් බෙදලා දුන්නා.

පොත් පත් ලබාගත්ත ඉස්කෝලේ අයියලා අක්කලා නංගිලා මල්ලිලා ඉතා ප්‍රීතියට  පත් වුනා. මායා කන්දෙ යාළුවන්ට ගොඩක් ස්තුති කළා.



පුංචි අපිත් ඒ වාගේ
දරුවන් වෙමු ලෝතලයට
අලුත් අලුත් වැඩ කරමින්
නව නිපැයුම් බිහි කරමින්
ලෝකය දින දින බබළවනා!



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධණය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා සංවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමෙතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)